# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


## 2018 අප්‍රේල් මස 27 වන දින

## II වන කොටස

## අතිරේකය

(2018.05.03 දින නිකුත් කරන ලදී)


## 1990 සුවසැරිය පදනම

**1990 සුවසැරිය පදනම පිහිටුවීම සඳහා ද, ඊට සම්බන්ධ සහ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිල : රු. 34.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එල්. ඩී.— ඕ. 54/2017.

**1990 සුවසැරිය පදනම පිහිටුවීම සඳහා ද, ඊට සම්බන්ධ සහ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

පූර්විකාව.

පරිපූර්ණ, කඩිනම්, විශ්වාසනීය සහ ගුණාත්මක පූර්ව රෝහල් ප්‍රතිකාර සේවා ලබා දීම මගින් ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන්රථ සේවාවන් අත්‍යවශ්‍ය සේවාවක් වශයෙන් රජය විසින් හඳුනාගනු ලැබ ඇති බැවින්, ඉන්දීය රජයෙන් ලද ප්‍රදානයක් සමග ප්‍රථමයෙන් බස්නාහිර සහ දකුණු පළාත් තුළ නොමිලේ පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන්රථ සේවාවක් පිහිටුවා ඇති හෙයින් ද:

පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන්රථ සේවාව මුළු දිවයිනම ආවරණය කිරීම සඳහා ව්‍යාප්ත කිරීමට සහ බාධාවකින් තොරව තිරසාර ආකාරයකින් එම සේවාව ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීමට මේ වන විට අවශ්‍ය වී ඇති හෙයින් ද:

ඕනෑම තැනැත්තකුට නොමිලේ ලබා දෙන පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන්රථ සේවා කාර්යක්ෂමව කරගෙන යාම සඳහා පදනමක් පිහිටුවීමට සහ එකී පදනමෙහි බලතල සහ කර්තව්‍ය නිශ්චිතව දැක්වීමට අවශ්‍යව ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

**1.** මේ පනත 2018 අංක  දරන 1990 සුවසැරිය පදනම යනුවෙන් හඳුන්වනු ලබන අතර (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

### 1990 සුවසැරිය පදනම පිහිටුවීම

1990 සුවසැරිය පදනම පිහිටුවීම.

**2.** (1) (මෙහි මින්මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1990 සුවසැරිය පදනම යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු පදනමක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) පදනම (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

**පදනමේ පරමාර්ථ.**

3. (අ) ඕනෑම තැනැත්තකුට පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන්රථ සේවා සහ හදිසි ප්‍රතිචාර සේවා නොමිලේ සැපයීම ;

(ආ) ආසන්නම සෞඛ්‍ය සේවා සපයන්නා වෙත තැනැත්තකු ළඟා වන තුරු ආරක්ෂිත සහ සායනික ක්‍රියාකාරී පරිසරයක් තුළ හදිසි සහ කාර්යක්ෂම පූර්ව රෝහල් ප්‍රතිකාර නොමිලේ සැපයීම,

පදනමේ පරමාර්ථ විය යුතු ය.

**පදනමේ බලතල කර්තව්‍ය සහ කාර්ය.**

4. (අ) යම් තැනැත්තකුට ආරක්ෂිත සහ සායනික පරිසරයක් තුළ ගිලන්රථ සේවා, හදිසි ප්‍රතිචාර සේවා සහ ජීවිත ආරක්ෂක පූර්ව රෝහල් ප්‍රතිකාර නොමිලේ සැපයීම ;

(ආ) පුහුණු කිරීම, උපකරණ සැපයීම සහ අමාත්‍යවරයා විමසා පදනම විසින් නිශ්චය කරන ලද කළමනාකරණ ගාස්තුවක් මත ලාභ අරමුණු කර නොගත් සංවිධාන මගින් නොමිලේ සපයනු ලබන වෙනත් ගිලන්රථ, සේවා කළමනාකරණය කිරීම ඇතුළුව පදනම විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් තැනැත්තකුට වෙනත් යම් සේවා සැපයීම ;

(ඇ) පදනම සතු චංචල හෝ නිශ්චල දේපළ දැරීම, බද්දට හෝ කුලියට ලබා ගැනීම හෝ ලබා දීම, විකිණීම, උකස් කිරීම, ප්‍රදානය කිරීම, පැවරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඈ) මුදලින් හෝ අන්‍යාකාරයකින් ප්‍රදාන, තෑගි හෝ පරිත්‍යාග ලැබීම ;

(ඉ) සෞඛ්‍ය හෝ මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද යම් නිලධරයකු හෝ නියෝජිතයකු හරහා පදනමේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් කොන්ත්‍රාත් හෝ ගිවිසුම්වලට ඇතුළත් වීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම;

(ඊ) උචිත යයි එය විසින් සලකනු ලැබිය හැකි පරිදි යම් බැංකුවක යම් ගිණුමක් ආරම්භ කර පවත්වාගෙන යාම සහ එකී ගිණුම පවතින අදාළ ලිඛිත නීතීන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීම ;

(උ) පදනමේ අරමුදල කළමනාකරණය කිරීම, පාලනය, පරිපාලනය සහ ක්‍රියාත්මක කිරීම ; සහ

(ඌ) මේ පනතේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා හෝ මේ පනත යටතේ පදනමට පවරා ඇති බලතල සහ කාර්යය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා සුදුසු හෝ ආනුෂංගික විය හැකි වෙනත් සියලු ක්‍රියා සිදු කිරීම,

පදනමේ බලතල, කර්තව්‍ය සහ කාර්ය විය යුතු ය.

දේපළ දැරීමට පදනම සතු බලය.

**5.** යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් , රික්තවරණයක් ප්‍රකාරව හෝ අන්‍යාකාරයකින් පදනම වෙත පවරනු ලැබිය හැකි නිශ්චල හෝ චංචල දේපළ ලබා ගැනීමට හෝ දැරීමට පදනමට නීතියෙන් හැකියාව තිබිය යුතු අතර, මේ පනතේ කාර්යය සඳහා එම සියලු දේපළ පදනම විසින් දරනු ලැබිය යුතු ය.

II වන කොටස

**කටයුතු පරිපාලනය සහ කළමනාකරණය**

පදනමේ පරිපාලනය මණ්ඩලය වෙත පැවරීම.

**6.** (1) පදනමේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

(2) පදනමේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින්, මේ පනතින් පදනම වෙත පවරා ඇති හෝ නියමකර ඇති බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සිදු කළ යුතු ය.

මණ්ඩලයේ සංයුතිය.

**7.** (1) මණ්ඩලය-

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත් වූ සාමාජිකයන්ගෙන්, එනම්-

(i) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ii) සෞඛ්‍යය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(iii) පොලිස්පතිවරයා හෝ ඔහුගේ අනුයෝජිතයකු ; සහ

(ආ) (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන් " යනුවෙන් සඳහන් කරනු ලබන) වෛද්‍ය විද්‍යාව, ඖෂධ වෛද්‍ය තාක්ෂණය, මූල්‍ය, කළමනාකරණය, පරිපාලනය හෝ නීතිය යන ක්ෂේත්‍රයන් හි අධ්‍යයන හෝ වෘත්තීය සුදුසුකම් සහ ඇත්දැකීම් සහිත, ජනාධිපතිවරයා විසින් පත් කරන ලද වෙනත් සාමාජිකයන් සිව් දෙනකුගෙන්.

සමන්විත වන්නේ ය.

මණ්ඩලයේ සභාපතිවරයා.

**8.** (1) ජනාධිපතිවරයා විසින්, පත්කළ සාමාජිකයන් අතරින් එක් අයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත්කළ යුතු ය.

(2) ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම, ජනාධිපතිවරයා විසින් එය පිළිගනු ලබන දිනයේ සිට බලාත්මක වන්නේ ය.

(3) ජනාධිපතිවරයා විසින් සභාපතිවරයා හේතු දක්වා සභාපති ධූරයෙන් ඉවත් කළ හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානයන්ට යටත් ව සභාපතිවරයාගේ ධූර කාලය මණ්ඩලයේ ඔහු සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතු ය.

(5) රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවයකට පත්වීම, ශ්‍රී ලංකාවෙන් බැහැර වීම හෝ වෙනත් යම් හේතුවක් මත සභාපතිවරයාට තාවකාලිකව ස්වකීය ධුරයේ කටයුතු ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් වෙනත් යම් පත්කළ සාමාජිකයකු ඔහුගේ සාමාන්‍ය කාර්යයන්ට අමතරව සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයකු වීමට නුසුදුස්සකු වීමට හේතු.

**9.** යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභාවක සභිකයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එසේ පත් වුවහොත් ;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වේ නම් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින නීතිය යටතේ, සිහිවිකල තැනැත්තකු බවට අනාවරණය වූ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම් ;

(ඈ) ශ්‍රී ලංකාවේ බලාත්මක යම් නීතියක් යටතේ වස්තුභංගත්වයට පත් වූවකු හෝ බංකොලොත්භාවයට පත්වූවකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ සහ නිදහස් කරනු නොලැබූ වස්තුභංගත්වයට පත් වූවකු හෝ බංකොලොත් වූවකු වන තැනැත්තකු වන්නේ නම් ;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටින හෝ විඳ ඇති තැනැත්තකු වන්නේ නම් ;

(ඊ) පදනම මගින් හෝ පදනම වෙනුවෙන් ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් දරන හෝ භුක්ති විඳින තැනැත්තෙක් වන්නේ නම් ; හෝ

(උ) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ස්වකීය කර්තව්‍යයන් ඔහු විසින් ඉටු කිරීමේ දී අහිතකර ලෙස බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් යම් සම්බන්ධතාවක් ඇති තැනැත්තෙක් වන්නේ නම්,

එම තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් අඛණ්ඩව කටයුතු කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

**සාමාජිකයන්ගේ ධුර කාලය.**

**10.** සෑම පත්කළ සමාජිකයකු ම ඉල්ලා අස්වීමෙන්, මියයාමෙන් හෝ ඉවත් කිරීමෙන් ස්වකීය ධුරය කලින් හිස් කළහොත් මිස, ඔහු පත්කළ දින සිට වසර තුනක කාල සීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, ඉවත් කරන ලද සාමාජිකයකු හැරුණු කොට එකී සාමාජිකයා නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

**සාමාජිකයන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම.**

**11.** (1) පත්කළ සෑම සාමාජිකයකුට ම, තත්කාර්ය සඳහා ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, ඕනෑම වේලාවක, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලිඛිතව පිළිගනු ලබන දින සිට බලාත්මක විය යුතු ය.

(2) පත්කළ යම් සාමාජිකයකු රෝගාතුර වීම, අශක්නුතාවයකට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර වීම හේතුවෙන් තාවකාලිකව ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී ජනාධිපතිවරයා විසින් 7 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(3) ජනාධිපතිවරයා විසින් හේතු දක්වා යම් පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) පත්කළ සාමාජිකයකු මියයාම, ධුරයෙන් අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම යන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් 7 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත්කළ තැනැත්තා විසින්, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

**12.** (1) මණ්ඩලයේ රැස්වීම්, යටත් පිරිසෙයින් මසකට එක් වතාවක් පවත්වනු ලැබිය යුතු අතර, මණ්ඩලයේ රැස්වීමක් සඳහා වන ගණපූරණය සාමාජිකයන් හතරදෙනකු විය යුතු ය.

මණ්ඩලයේ ගණපූරණය සහ රැස්වීම්.

(2) සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන්ගෙන් තෝරා පත් කරගත් සාමාජිකයකු, එකී රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සෑම ප්‍රශ්නයක් ම, එකී රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) මේ වගන්තියේ පූර්ව විධිවිධානයන්ට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් එහි කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

**13.** මණ්ඩලය විසින් ස්වකීය සාමාජිකයන් අතරේ යම් පුරප්පාඩුවක් පැවතිය ද එය නොතකා ක්‍රියාකරනු ලැබිය හැකි අතර, මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් එහි සාමාජිකයන් අතරේ යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව මත ම පමණක් අවලංගු නොවිය යුතු අතර, අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු බව.

**14.** මණ්ඩලයේ සාමාජිකයන්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය මත ජනාධිපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකට සහ යම් අනු ප්‍රමාණ මත පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

පදනමේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

**15.** (1) පදනමේ මුද්‍රාව මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන, යම් තැනැත්තකු භාරයේ තැබිය යුතු ය.

පදනමේ මුද්‍රාව.

(2) පදනමේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකිය.

(3) මණ්ඩලයේ අවසරය සහිතව සහ මණ්ඩලයේ සභාපතිවරයා සහ වෙනත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට හෝ පදනමේ මුද්‍රාව නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයේ හෝ ලේඛනයේ තම නම අත්සන් කළ යුතු ය:

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයට පදනමේ මුද්‍රාව තබන විටක දී සභාපතිවරයාට පැමිණීමට නොහැකි වන අවස්ථාවක දී, මේ උපවගන්තියේ පූර්ව විධිවිධානයන්ට අනුකූලව එකී සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කිරීමට තත්කාර්යය සඳහා සභාපතිවරයා විසින් ලිඛිතව අවසර ලබාදෙන ලද මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු සුදුසුකම් ලැබිය යුතු ය.

(4) පදනම විසින්, පදනමේ මුද්‍රාව යොද ඇති සාධන පත්‍ර හෝ ලේඛනවල රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය.

## III වන කොටස

### පදනමේ ප්‍රධාන විධායක නිලධරයා සහ කාර්ය මණ්ඩලය

ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා පත් කිරීම.

**16.** (1) මණ්ඩලය විසින් අමාත්‍යවරයා විමසා සහ (2) වන උපවගන්තිය යටතේ නිශ්චිතව සඳහන් කරන ලද සුදුසුකම සහ බඳවා ගැනීමේ පටිපාටිය සැලකිල්ලට ගනිමින් (මේ පනතේ "ප්‍රධාන විධායක නිලධරයා" වශයෙන් සඳහන් කරනු ලබන) පදනමේ කාර්ය මණ්ඩලයට ප්‍රධාන විධායක නිලධරයකු පත් කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ එකඟතාවය සහිතව ප්‍රධාන විධායක නිලධාරි තනතුර සඳහා සුදුසුකම් සහ බඳවා ගැනීමේ පටිපාටිය නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(3) ප්‍රධාන විධායක නිලධරයා විසින් මණ්ඩලයේ සාමාන්‍ය විධානයන්ට සහ අධීක්ෂණයට යටත් ව-

(අ) කාර්ය මණ්ඩලයේ පරිපාලනය සහ පාලනය ඇතුළුව පදනමේ කටයුතු පරිපාලනය කිරීම ;

(ආ) මණ්ඩලයේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු වීම ; සහ

(ඇ) මණ්ඩලය විසින් ඔහුට පවරනු ලැබිය හැකි සියලු කර්තව්‍යයන් කරගෙන යාම,

සිදු කරනු ලැබිය යුතු ය.

(4) ප්‍රධාන විධායක නිලධරයාට මණ්ඩලයේ යම් රැස්වීමකට සහභාගී වීමට සහ කතා කිරීමට හිමිකම් ලැබිය යුතු නමුත් ඒ රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.

(5) ප්‍රධාන විධායක නිලධරයා විසින් ඔහුගේ බලතල හෝ කර්තව්‍යයන් කිසිවක් පදනමේ යම් නිලධරයකුට ලිඛිතව පැවරීම කරනු ලැබිය හැකි අතර, ඒ බලතල හෝ කර්තව්‍යයන් පවරනු ලැබුවේ යම් නිලධරයකුට ද, ඒ නිලධරයා විසින් ඒ බලතල සහ කර්තව්‍යයන් ප්‍රධාන විධායක නිලධරයාගේ විධානයන්ට යටත් ව ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

(6) මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධරයා -

(අ) ඔහුට අයත් කාර්යය කිරීමට ස්ථිරව අපොහොසත් තත්ත්වයට ඔහු පත්ව ඇත්තම් ; හෝ

(ආ) මණ්ඩලයේ මතය අනුව යම් වංචාකාරී හෝ නීති විරෝධී ස්වභාවයෙන් යුතු ක්‍රියාවක් හෝ පදනමේ සම්බන්ධතාවලට අගතියක් වන ක්‍රියාවක් ඔහු විසින් සිදුකර ඇති නම් ; හෝ

(ඇ) පදනම විසින් නිකුත් කළ යම් විධානයන්ට අනුකූල වීමට අපොහොසත් වී ඇත්නම්,

ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ පාරිශ්‍රමික ප්‍රධාන විධායක නිලධරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

පදනමේ කාර්ය මණ්ඩලය.

**17.** (1) මේ පනතේ විධිවිධානයන්ට යටත් ව, පදනමෙ හි බලතල සහ කර්තව්‍යයන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට අවශ්‍ය විය හැකි යම් සේවා නියුක්තිකයන් සේවයට ගැනීම හෝ පත් කිරීම පදනම විසින් සිදු කරනු ලැබිය හැකිය.

(2) මණ්ඩලයට පනතේ විධිවිධානයන්ට යටත් ව-

(අ) පදනමේ නිලධරයන් සහ සේවා නියුක්තිකයන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීමට සහ ඔවුන් ඉවත් කිරීමට ;

(ආ) පදනමේ නිලධරයන්ගේ සහ සේවා නියුක්තිකයන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නිශ්චය කිරීමට ; සහ

(ඇ) අමාත්‍යවරයාගේ එකඟතාවය සමග එම නිලධරයන්ට සහ සේවා නියුක්තිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණයන් නියම කිරීමට,

බලය තිබිය යුතු ය.

(3) පදනමේ සියලු සේවා නියුක්තිකයන් විසින්, සේවා නියුක්තියෙන් එක් මසක් ඇතුළත, ඔවුන්ගේ සමීප ඥාතීන්ගේ සම්බන්ධතා ඇතුළුව පදනමේ කටයුතු සහ ගනුදෙනු සම්බන්ධයෙන් වන ඔවුන්ගේ ඍජු හෝ වක්‍ර පෞද්ගලික සම්බන්ධතා හෝ එකී සේවා නියුක්තිකයාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇති කරුණු සම්බන්ධයෙන් ලිඛිතව පදනමට ප්‍රකාශ කළ යුතු ය.

IV වන කොටස

මුදල්

පදනමේ අරමුදල.

18. (1) පදනමට (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී (මේ පනතේ "ජී.ඊ.එල්. ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජී.වී.කේ. එම්රි ලන්කා ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයෙහි බැරට ඇති සියලු මුදල් නියමිත දින සිට බලපැවැත්වෙන පරිදි අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය.

(3) පදනමේ අරමුදලට-

(අ) පදනමේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල්;

(ආ) මේ පනත යටතේ පදනමෙහි බලතල සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී පදනමට ලැබුණු සියලු මුදල්; සහ

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව කවර ආකාරයේ හෝ යම් මූලාශ්‍රයකින් ආදායම, ගාස්තු, අයකිරීම්, ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලෙස පදනමට ලැබිය හැකි යම් සියලු මුදල්,

බැර කරනු ලැබිය යුතු ය.

(4) අරමුදලින්-

(අ) මේ පනත යටතේ පදනමේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම වෙනුවෙන් පදනමට,

උපචිත වූ යම් වියදමක් පියවා ගැනීමට අවශ්‍ය කරන සියලු මුදල් ප්‍රමාණයන්; සහ

(ආ) මේ පනත මගින් හෝ මේ පනත යටතේ අරමුදලින් ගෙවීමට නියම කර ඇති සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලය විසින් අරමුදලින් මුදල් ගෙවීම සම්බන්ධයෙන් රීති සකස් කරනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**19.** (1) පදනමේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතු ය.

(2) මණ්ඩලය විසින්, පදනමේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ පදනමේ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන පදනමේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) මණ්ඩලය විසින් විගණකගේ වාර්තාව සමග විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය එකී වාර්තාව අදාළ වන ගිණුම් වර්ෂය අවසානයේ සිට දින එකසිය පනහක් ඇතුළත අමාත්‍යවරයාට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා විසින් එය ලැබීමෙන් මාස දෙකක් ඇතුළත එකී ප්‍රකාශය සහ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

අපරාධ හෝ සිවිල් නඩු කටයුතු සම්බන්ධයෙන් විත්තිවාචකය.

**20.** (අ) මණ්ඩලයේ සාමාජිකයකු හෝ;

(ආ) පදනමේ යම් සේවා නියුක්තිකයකු හෝ කළමනාකරුවකු හෝ විසින් සිදු කරන ලද හෝ සිදුකිරීම පැහැර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් වන සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී මේ පනත යටතේ හෝ මේ පනත යටතේ නිකුත් කරන ලද හෝ සාදන ලද යම් නියමයක්, රීතියක්, නියෝගයක් හෝ විධානයක් යටතේ වන සිය වගකීම ඉටු කිරීමේ දී හෝ ඉටු කිරීමට අදහස් කිරීමේ දී හෝ ඒ සම්බන්ධිතව නිසි උද්‍යෝගය සහ සාධාරණ සැලකිල්ල ක්‍රියාත්මක කළ බවට සහ සද්භාවයෙන් කටයුතු කළ බවට ඔහු විසින් ඔප්පු කරන්නේ නම්, එය විත්තිවාචකයක් විය යුතු ය.

*උපචිත වන ලද වියදම් අරමුදලින් ගෙවිය යුතු බව.*

**21.** පදනම විසින් සිදු කරන ලද යම් ක්‍රියාවක් හෝ මේ පනත යටතේ හෝ පදනමේ විධානය මත මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ පදනමේ යම් නිලධරයකු හෝ සේවා නියුක්තිකයකු හෝ අනුයෝජිතයකු හෝ විසින් සිදු කරනු ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් පදනමට හෝ එකී වෙනත් තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී එකී වෙනත් තැනැත්තකු විසින් උපචිත කරන ලද යම් වියදමක් එකී ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය විසින් තීරණය කරන්නේ නම් පදනමින් ගෙවිය යුතු අතර, පදනම විසින් හෝ එකී යම් තැනැත්තා විසින් ගෙවන ලද හෝ අයකර ගන්නා ලද යම් වියදමක් වේ නම් එය අරමුදලට බැර විය යුතු ය.

## V වන කොටස

### සාමාන්‍ය

*අල්ලස් පනතේ අර්ථානුකූලව පදනම උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.*

**22.** පදනම අල්ලස් පනතේ (26 වන අධිකාරය) අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

*පදනමේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවා නියුක්තිකයන් රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව.*

**23.** මණ්ඩලයේ සියලු සාමාජිකයන්, ප්‍රධාන විධායක නිලධරයා සහ සියලු නිලධරයන් සහ සේවා නියුක්තිකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ කාර්ය සඳහා රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

*අමාත්‍යවරයාගේ විධාන.*

**24.** අමාත්‍යවරයා විසින් කලින් කලට මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීමට අදාළව සාමාන්‍ය හෝ විශේෂ විධාන මණ්ඩලයට නිකුත් කරනු ලැබිය හැකි ය.

*රීති.*

**25.** (1) මේ පනතේ විධිවිධානවලට යටත් ව, පදනම විසින් පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය:-

(අ) මේ පනත යටතේ රීති සෑදීමට බලය දෙන ලද හෝ නියම කරන ලද සියලු කාරණා සම්බන්ධයෙන්;

(ආ) මණ්ඩලයේ රැස්වීම සහ ඒ රැස්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ඇ) සේවා නියුක්තිකයකු පත් කිරීම, උසස් කිරීම, පාරිශ්‍රමික ලබා දීම සහ විනය පාලනය සහ සේවා නියුක්තිකයන්ට නිවාඩු සහ වෙනත් දීමනා ලබාදීම සම්බන්ධයෙන්;

(ඈ) මේ පනත යටතේ සේවා, හදිසි ප්‍රතිචාර සේවා සහ පූර්ව රෝහල් ප්‍රතිකාර ලබා දිය යුතු ආකාරය සම්බන්ධයෙන්;

(ඉ) පදනමේ කටයුතු සමග සම්බන්ධ වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන්.

(2) පදනම විසින් සාදන ලද සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය පළ කරන ලද දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක දී ක්‍රියාත්මකභාවයට පැමිණිය යුතු ය.

**26.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද- ව්‍යාවර්තන.

(අ) නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ දී ජී.ඊ.එල්. ආයතනයෙහි කාර්ය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ඉන්දීය ප්‍රදානය යටතේ මිල දී ගන්නා ලද ගිලන් රථ සහ වෛද්‍ය උපකරණ ඇතුළුව ජී.ඊ.එල්. ආයතනයට අයත් සියලු චංචල සහ නිශ්චල දේපළ නියමිත දිනයේ දී සහ ඊට පසුව පදනමේ චංචල සහ නිශ්චල දේපළ වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ආ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ලද ජී.ඊ.එල්. ආයතනයෙහි සේවා නියුක්තිකයන්, සේවකයන් සහ අනුයෝජිතයන් නියමිත දිනයේ දී සහ ඊට පසුව පදනමේ සේවා නියුක්තිකයන්, සේවකයන් සහ අනුයෝජිතයන් වශයෙන් සලකනු ලැබිය යුතු අතර එම සේවා නියුක්තිකයන්, සේවකයන් සහ අනුයෝජිතයන්

නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ජී.ඊ.එල්. ආයතනය යටතේ ඔවුන් විසින් භුක්ති විඳින ලද සමාන නියම සහ කොන්දේසි මතම තවදුරටත් පදනමේ ධුර දරනු ලැබිය යුතු ය;

(ඇ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පවත්නා සහ බලාත්මකව පවතින සහ ජී.ඊ.එල්. ආයතනය විසින් පාර්ශවයක් වන හෝ ජී.ඊ.එල්. ආයතනයේ වාසියට පවත්නා ජී.ඊ.එල්. ආයතනයේ සියලු ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම්, ඇපකර, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජනය ප්‍රදනය කිරීම් සහ කවර ආකාරයේ හෝ වෙනත් සාධන පත්‍ර නියමිත දිනයේ දී සහ නියමිත දිනයට පසුව පදනම විසින් එළඹෙන ලද හෝ පදනමේ වාසියට පක්ෂව ප්‍රදනය කරන ලද ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම්, ඇපකර, ඇටොර්නි බලපත්‍ර, නෛතික නියෝජනය ප්‍රදනය කිරීම් සහ වෙනත් සාධන පත්‍ර වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ඈ) වෙනත් යම් නීතියක විධිවිධාන සලසා ඇති ආකාරයට විශේෂයෙන් අවලංගු කර හෝ ආදේශ කර ඇත්නම් මිස, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවත්නා හෝ බලාත්මකව පවතින යම් නියාමන මණ්ඩලයක් හෝ අධිකාරියක්, පළාත් සභාවක්, හෝ පළාත් පාලන ආයතනයක් විසින් ජී.ඊ.එල්. ආයතනය වෙත ප්‍රදනය කරන ලද සියලු අනුමත කිරීම් හෝ බලපත්‍ර නියමිත දිනයේ දී සහ නියමිත දිනයට පසුව, පදනමට ප්‍රදනය කරන ලද අනුමත කිරීම් හෝ බලපත්‍ර වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ඉ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ශ්‍රී ලංකා රජය, එහි දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුළුව වෙනත් යම් තැනැත්තකු හා ජී.ඊ.එල්. ආයතනය හා අතර ශ්‍රී ලංකාව තුළ හෝ පිටත පවත්නා ගෙන යනු ලබන යම් ගිණුමක්, එය ජී.ඊ.එල්. ආයතනයෙහි වත්කමක් හෝ වගකීමක් වුව ද නියමිත දිනයේ දී හා ඊට පසුව එම ගිණුම ජී.ඊ.එල්. ආයතනය හා වෙනත් යම් තැනැත්තන් සමඟ දිගටම පවත්වාගෙන යන්නේ නම් ඒ සඳහා අදාළ වන්නා වූ හිලව් කිරීමේ අයිතීන් ද ඇතුළුව එම වගකීම්

හා සිද්ධීන්ට යටත්ව සහ එම අයිතිවාසිකම් සමඟ පදනම හා එම වෙනත් යම් තැනැත්තන් අතර ඇති කර ගනු ලැබූ ගිණුමක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම ගිණුම සම්බන්ධයෙන් නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින එම ගිණුම සම්බන්ධයෙන් වෙනත් යම් තැනැත්තා විසින් ලබා දෙන ලද යම් උපදේශයක්, නියෝගයක්, විධානයක්, බලය පැවරීමක් හෝ අධිකාරියක් අහෝසි කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබුවහොත් මිස හෝ කරනු ලබන තෙක් පදනම සහ එම වෙනත් යම් තැනැත්තා අතර වන ගිණුම සම්බන්ධයෙන් අදාළ විය යුතු හා බලපෑ යුතු ය;

(ඊ) යම් නීතියක් යටතේ ජී.ඊ.එල් ආයතනය විසින් හෝ ඊට විරුද්ධව පවරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවත්නා කවර හෝ ආකාරයේ සියලු ඉල්ලීම්, නඩු, නීති කෘත්‍ය හෝ අභියාචනා නියමිත දිනයේ දී සහ නියමිත දිනයට පසුව පදනම විසින් හෝ ඊට එරෙහිව පවරන ලද ඉල්ලීම්, නඩු, නීති කෘත්‍ය හෝ අභියාචනා වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව පවත්වාගෙන යා හැකි ය;

(උ) ජී.ඊ.එල් ආයතනයේ යම් සේවා නියුක්තිකයකුගේ පශ්චාත් රැකියා ප්‍රතිලාභයට අදාළ විශ්‍රාම වැටුපක්, පාරිතෝෂික මුදලක් හෝ වෙනත් වගකීමක් සම්බන්ධයෙන් වන සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවත්නා යම් විශ්‍රාම අරමුදලක්, පාරිතෝෂික අරමුදලක් හෝ අරමුදල් නොමැති වගකීමක් නියමිත දිනයේ දී හෝ නියමිත දිනයට පසුව මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය සහිතව එම සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි, පදනමේ විශ්‍රාම අරමුදලක් පාරිතෝෂිත අරමුදලක් හෝ යම් වගකීමක් වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ඌ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ජී.ඊ.එල් ආයතනය විසින් එහි සේවා නියුක්තිකයන්ගේ සුභසිද්ධිය පිණිස කම්කරු කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද

යම් අර්ථ සාධක අරමුදලකට දයකයකු වූයේ නම්, නියමිත දිනයේ දී සහ ඊට පසුව එකී සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන්, පදනම එම අර්ථ සාධක අරමුදලෙහි දායකයා වශයෙන් පදනම සලකනු ලැබිය යුතු ය;

(එ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවත්නා ජී.ඊ.එල් ආයතනයේ සියලු බදු ණය, ආපසු සිදු කරන ලද ගෙවීම්, පාඩු, සහන, නිදහස් කිරීම්, සහන ප්‍රතිලාභ සහ වගකීම් නියමිත දිනයේ දී සහ ඊට පසුව පදනමේ බදු ණය, ආපසු සිදු කරන ලද ගෙවීම්, පාඩු, සහන, නිදහස් කිරීම්, ප්‍රතිලාභ සහ වගකීම් වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ඒ) යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී යම් අධිකරණයක් විසින් ජී.ඊ.එල් ආයතනයට පක්ෂව හෝ ඊට විරුද්ධව එළඹෙන ලද සියලු නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ නියෝග නියමිත දිනයේ දී සහ ඊට පසුව පදනම විසින් හෝ ඊට විරුද්ධව එළඹෙන ලද නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ නියෝග වශයෙන් සළකනු ලැබිය යුතු ය;

(ඔ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ජී.ඊ.එල් ආයතනයේ වාසියට පවත්නා වෙළෙඳ ලකුණු, පේටන්ට්, මෘදුකාංග ඇතුළු බුද්ධිමය දේපළ සම්බන්ධ සියලු අයිතිවාසිකම් නියමිත දිනයේ දී සහ ඊට පසුව සුවසැරිය පදනමේ වාසියට පවත්නා යම් අයිතිවාසිකම් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

**27.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ- අර්ථ නිරූපණය.

"සමීප ඥාතියා" යන්නෙන්, කලත්‍රයා හෝ යැපෙන දරුවා අදහස් වේ.

"ජී.වී.කේ. එම්රිලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ සංස්ථාගත කරන ලද සමාගම් ලියාපදිංචි අංක පී. වී. 111132 දරන සමාගම අදහස් වේ;

"සෞඛ්‍ය සේවා සපයන්නා" යන්නට, යම් රෝගී භාවයකින්, තුවාලයකින් හෝ අබලතාවකින් පෙළෙන

තැනැත්තන් භාර ගැනීම සහ ඒ තැනැත්තාට වෛද්‍ය හා සාත්තු සේවා සහ වෛද්‍ය ප්‍රතිකාර සැලසීම සඳහා භාවිත කරනු ලබන හෝ භාවිත කිරීමට අදහස් කරනු ලබන යම් ආයතනයක් හෝ ස්ථානයක් ද, ආරෝග්‍යශාලාවක්, සාත්තු නිවාසයක්, මාතෘ නිවාසයක්, වෛද්‍ය රසායනාගාරයක්, ලේ බැංකුවක්, දන්ත ශල්‍යාගාරයක්, බෙහෙත් ශාලාවක් හා ශල්‍යාගාරයක්, රෝගීන් බලන ස්ථානයක් සහ සෞඛ්‍ය පරීක්ෂණ සේවා හෝ සෞඛ්‍ය ප්‍රවර්ධන සේවා සලසන ආයතනයක් ද ඇතුලත් වන නමුත්, නිරීක්ෂණ නිවාසයක්, මානසික රෝහලක්, යම් ඖෂධයක්, පිළියෙල කරන ලද බෙහෙත් සංයෝගයක් හෝ ඖෂධ නිෂ්පාදනයක් කලවම් කිරීම හා විකිණීම සඳහා තනිකරම අනන්‍යව භාවිත කරනු ලබන හෝ භාවිත කිරීමට අදහස් කරනු ලබන යම් පෞද්ගලික බෙහෙත් ශාලාවක් හෝ ෆාමසියක් හෝ ඖෂධ ශාලාවක් හෝ 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ සහ 1970 අංක 7 දරන හෝමියෝපති පනතේ විධිවිධාන යටතේ වූ යම් කාර්යයක් සඳහා ලියාපදිංචි කරන ලද යම් ආයතනයක් හෝ පරිශ්‍රයක් හෝ එයට ඇතුළත් නොවේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, සුවසැරිය පදනම විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"පූර්ව රෝහල් ප්‍රතිකාර" යන්නට, යම් අසනීපයකින්, තුවාලයකින් හෝ අශක්නුතාවයකින් පීඩා විඳින තැනැත්තකු සෞඛ්‍ය සත්කාර සපයන්නකු වෙත ළඟා වන තුරු ලබා දෙනු ලබන ප්‍රථමාධාර, හදිසි සත්කාර හෝ ප්‍රතිකාර ඇතුළත් වේ;

"ජනාධිපතිවරයා" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා අදහස් වේ;

"සැලකිය යුතු සම්බන්ධතාවය" යන්නෙන්-

(අ) සමාගමකට අදාළව වෙනත් යම් සමාගමක් හෝ තනි පුද්ගලයකු හෝ ඔහුගේ ඥාතියකු විසින් තනිව හෝ එක්ව එම සමාගමේ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට දහයක් ඉක්මවනු ලබන ගෙවා නිමි අගයක් සහිත කොටස් ප්‍රමාණයක් සඳහා වාසිදයක සම්බන්ධතාවයක් දැරීම හෝ එකී සමාගම වෙනුවෙන් තනි පුද්ගලයෙක් හෝ ඔහුගේ ඥාතියකු හෝ වෙනත් සමාගමක් විසින් ලබාදෙන ලද ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට දහයකට අඩු නොවන ප්‍රමාණයක් දක්වා වන ඇපයක් හෝ වන්දි මුදලක් පැවතීම;

(ආ) ආයතනයකට අදාළව, යම් තනි පුද්ගලයෙක් හෝ ඔහුගේ ඥාතියකු විසින් තනිව හෝ එක්ව ආයතනයේ සියලු හවුල්කරුවන් විසින් දයක වූ මුළු ප්‍රාග්ධනයෙන් සියයට දහයකට වඩා නියෝජනය කරනු ලබන වාසිදයක සම්බන්ධතාවයක් හෝ එකී ආයතනය වෙනුවෙන් තනි පුද්ගලයකු හෝ එම පුද්ගලයාගේ කලත්‍රයා, දෙමවුපියන් හෝ දරුවකු විසින් ලබාදෙන ලද ප්‍රාග්ධනයෙන් සියයට දහයකට වඩා නොඅඩු මුදල් ප්‍රමාණයක් සඳහා වන සහතිකයක් හෝ වන්දි මුදලක් පැවතීම.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.